Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

# ගණිතය දැනුම මිනුම තරගය - 2018


**9 ශ්‍රේණිය** **කාලය : පැය 1 යි.**

**නම ------------------------------------------------ විදුහල------------------------------------------**

**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයෙහි ම පිළිතුරු සපයන්න.**

**1.** $2^{-3} \times 2^{-2} \times 2^{-1} \times 2^{0} \times 2^{1} \times 2^{2} \times 2^{3}$ හි අගය සොයන්න.

**2.** අඳුරු කර ඇති ප්‍රමාණය මුලු රූපයෙන් කිනම් ප්‍රතිශතයක්ද ?



**3.** එක්තරා පන්තියක ළමුන්ගෙන් $\frac{2}{5}$ ක් අත් පන්දු ක්‍රීඩාව කරති. පන්තියේ ගැහැණු ළමයි 21ක් සිටිති. අවම වශයෙන් පිරිමි ළමුන් කීදෙනෙක් සිටී ද ?

**4.** අනිද්දාට පසු දිනය ඉරිදා නම් පෙරේදාට පෙර දිනය කවදාද ?

**5.** වෘත්තාකාර පොකුණක පාසි වර්ගයක් වැඩේ. එය අද තිබෙන ප්‍රමාණයට වඩා හෙට වැඩෙන ප්‍රමාණය දෙගුණ වේ. මේ ආකාරයෙන් පාසි වැවී දින 16කින් පොකුණ සම්පූර්ණයෙන් වැසී යයි. පොකුණෙන් $\frac{1}{4}$ ක් වැසී යාම සඳහා දින කීයක් ගතවේද?

**6.** වෙළෙන්දෙක් භාණ්ඩයක් 10%ක ලාභ ලැබෙන සේ මිල ලකුණු කරයි. භාණ්ඩය විකිණීමේ දී 10%ක වට්ටමක් ලබා දුන්විට වෙළෙන්දාට ලැබෙනුයේ ලාභයක්ද ? අලාභයක් ද? එහි ප්‍රතිශතය සොයන්න.

**7.** 25 ට වඩා අඩු සංඛ්‍යා අතරින් වැඩිම සාධක සංඛ්‍යාවක් ඇති සංඛ්‍යාව ලියා, එහි සියලුම සාධක ලියා දක්වන්න.


**8.** ඝනකයක පැත්තක දිග හරි අඩක් කළහොත් එහි පරිමාව, මුල් පරිමාවෙන් කිනම් භාගයක් වේද?

**9.** 49 සමචතුරස්‍ර සංඛ්‍යාවකි. එය ලැබෙනුයේ කුමන ත්‍රිකෝණ සංඛ්‍යා දෙක එකතු කිරීමෙන්ද ?


**10.** සංඛ්‍යාවක් 2, 3, 4, 5, 6 යන සංඛ්‍යාවලින් බෙදූ විට එක බැගින් ඉතිරි වේ. එයට ගැළපෙන කුඩාම සංඛ්‍යාව කීයද?

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**11.** පහත රූපයේ දැකිය හැකි ත්‍රිකෝණාකාර හැඩ ගණන සොයන්න.




**12.** පහත දැක්වෙන යන්ත්‍රයට 4 ඇතුළු කළ විට ලැබෙන අගය ලියන්න.




**13.** ශීර්ෂ 12ක් හා මුහුණත් 20ක් ඇති ඝන වස්තුවක දාර ගණන සොයන්න.


**14.** රූපයේ XYSQ චතුරස්‍රයේ වර්ගඵලය $200\text{cm}^2$ වේ. ලකුණු කර ඇති දත්ත අනුව, PQRS චතුරස්‍රයේ වර්ගඵලය සොයන්න.




**15.** සංඛ්‍යාවක් සිතා එය තුනෙන් ගුණ කොට දෙකක් අඩු කළ විට සිතූ සංඛ්‍යාව ම ලැබේ. එසේ නම් සිතූ සංඛ්‍යාව කුමක්ද ?

**16.** 2018.05.18 දිනය අයත් වන ශත වර්ෂය අවසන් වන දිනය ලියන්න.

**17.** ABC ත්‍රිකෝණයේ AB=AC ද AP=AQ ද $B\hat{A}P = 36^0$ ද වේ. $C\hat{P}Q$ හි අගය කීයද ?




**18.** $\frac{a}{b} = \frac{1}{5}$ නම් $\frac{a+b}{b-a}$ හි අගය සරලම ආකාරයෙන් දක්වන්න.

**19.** $a * b = a^2 + b^2$ ලෙස අර්ථ දක්වා ඇත. $4 * 5$ හි අගය සොයන්න.

**20.** $15873 \times 7 = 111\ 111$ නම්, $15873 \times 63$ හි අගය සොයන්න.